# බළන්ගොඩ නගර සභාව

## 2017 වර්ෂයට බළන්ගොඩ නගර සභාවට අයත් බළන්ගොඩ බස් නැවතුම්පලෙහි පෞද්ගලික බස්ගාල් ගාස්තු අය කිරීම සඳහා සුදුසු බදු කරුවක් තෝරා ගැනීම සඳහා ලංසු අයදුම්පත් කැඳවීම.

2017 ජනවාරි මස පළමු වන දින සිට 2017 දෙසැම්බර් මස තිස් එක් වන දින දක්වා වූ වර්ෂයක කාලයක් සඳහා පහත උපලේඛනයේ විස්තර කරනු ලබන අයිතමය බදු දීම වෙනුවෙන් මුද්‍රා තබන ලද ලංසු අයදුම්පත් බළන්ගොඩ නගර සභාවේ ලේකම් එස්.එච්.ඒ. කරුණාරත්න වන මා විසින් 2016 දෙසැම්බර් 21 වන දින පෙ. ව. 10.00 දක්වා භාරගනු ලැබේ. වැඩි විස්තර සතියේ වැඩ කරන දිනයන්හි වැඩ කරන වේලාව තුල දී කාර්යාලයීය දුරකථන අංක 045 - 22 872 75 ඇමතිමෙන් හෝ urbanbg@ sltnet.lk වෙතින් ලබාගත හැකි ය.

**ලංසුපත් නිකුත් කිරිමඃ**

2016 දෙසැම්බර් 20 වන දින ප.ව. 3.00 දක්වා ලංසුපත් බළන්ගොඩ නගර සභා කාර්යාලයේ දී නිකුත් කරනු ලැබේ.

**ලංසුපත් භාර ගැනීමඃ**

2016 දෙසැම්බර් මස 21 වන දින පෙ.ව.10.00 දක්වා ලංසුපත් භාර ගනු ලැබේ. ලංසු අයදුම් කරුවන් විසින් සම්පූර්ණ කර මුද්‍රා තබන ලද ලංසු අයදුම්පත් කාර්යාලයේ තැන්පත්කර ඇති ටෙන්ඩර් පෙට්ටියට අතින් ගෙනවිත් හෝ **"ලේකම් බළන්ගොඩ නගර සභාව"** යන ලිපිනයට 2016 දෙසැම්බර් මස 21 වන දින පෙ. ව. 10.00 ට පෙර ලැබෙන සේ තැපැලෙන් හෝ යොමුකළ හැකි ය. නියමිත වේලාවට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ලංසුපත් විවෘත කිරිමඃ**

2016 දෙසැම්බර් මස 21 වන දින පෙ.ව. 10.30 ට බළන්ගොඩ නගර සබා කාර්යාලයේ දී ලංසුපත් විවෘත කරනු ලැබේ. මෙම අවස්ථාවට ලංසු අයදුම්කරුවන්ට හෝ ඔවුන්ගේ බලය ලත් නියෝජිතයෙකුට හෝ සහභාගි විය හැකි ය.

### ඉහත කී උපලේඛනය

| අනු අංකය | ලංසුපත් කැඳවනු ලබන වෙළඳාමේ ස්වභාවය | ආපසු ගෙවනු ලබන ලංසු ඇප තැන්පත් මුදල | ආපසු ගෙවනු නොලබන ලංසුඅයදුම්පත් ගාස්තු | | | | අවම මාසික ලංසු මුදල |
|---|---|---|---|---|---|---|---|
| | | | ගාස්තුව | වැට් | ජා.ගො.බ | එකතුව | |
| 01 | බළන්ගොඩ නගරයේ පෞද්ගලික බස්ගාල් ගාස්තු අය කිරිම. | රු. 10,000.00 | රු. 1,000.00 | රු. 153.00 | රු. 20.00 | රු. 1,173.00 | රු. 121,500.00 |

**විශේෂ කොන්දේසිඃ**

- ✓ ලංසුඅයදුම්පත් ඉදිරිපත් කරනු ලබන ලියුම් කවරයේ වම්පස ඉහල කෙලවරේ තමා ඉදිරිපත් කරනු ලබන ලංසුවේ නම සඳහන් කළ යුතු ය.
- ✓ අවම ලංසුවට අමතරව රජය විසින් පනවනු ලබන බදු මුදල් ද ගෙවිය යුතු ය.
- ✓ තෝරා ගන්නා ලද බදු කරු ගිවිසුම් ඇප තැන්පත් මුදල් වශයෙන් මසක කුලී මුදලට සමාන මුදලක් සභාවට ගෙවිය යුතු අතර, එම කුලිය බදුකරු තෝරා ගෙන පළමු පැය තුළ බළන්ගොඩ නගර සභාවට ගෙවිය යුතු ය. එසේ නොගෙවන බදුකරුවන්ගේ අයදුම්පත් නියමිත කාලය අවසන් වනවාත් සමඟ ම ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- ✓ තෝරාගනු ලබන බදුකරු 2016.12.31 දින වන විට සභාව සමඟ ගිවිසුම් අත්සන් කළ යුතු ය.
- ✓ ඕනෑම ටෙන්ඩරයක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරිමේ අයිතිය බළන්ගොඩ නගර සභාවේ ප්‍රසම්පාදන කමිටුව සතු ය.

2016 දෙසැම්බර් මස 07 වන දින,
බළන්ගෙඩ නගරසභාවේ දී ය.

එස්.එච්.ඒ. කරුණාරත්න,
ලේකම්,
බළන්ගොඩ නගර සභාවේ බලතල කාර්යය හා කර්තව්‍ය ඉටු කිරීමේ නිලධාරී,
බළන්ගොඩ නගර සභාව.